# එයිට්කන්ස් ස්පෙන්ස්
# ඒකාබද්ධ තිරසාරත්ව ප්‍රතිපත්තිය

ව්‍යාපාරයේ දිගුකාලීන ශක්‍යතාව, ලාභදායීත්වය සහ අඛණ්ඩතාව සාක්ෂාත් කිරීම සම්බන්ධයෙන් වූ පෙරටුගාමී ප්‍රවේශයක් ලෙස ඒකාබද්ධ පැවැත්ම පිළිබඳ සංකල්පය අපි අවබෝධ කරගෙන සිටින්නෙමු. රටවල් ගණනාවක ක්‍රියාත්මක වන බහුවිධ ව්‍යාපාරික කණ්ඩායමක් වශයෙන්, කල් පවත්නා සංවර්ධනය සම්බන්ධයෙන් වූ විශ්වීය අභිලාෂයන් සහ ඇගයීම් සමඟ අපගේ ක්‍රමෝපායන් හා අනුගත වෙමින් ආදශර්වත් හා සාමූහික පුරවැසියන් වශයෙන් අපගේ කතර්ව්‍යය අඛන්ඩව ඉටු කිරීමට අපි කැපවී සිටින්නෙමු.

## <u>ප්‍රතිපත්ති ප්‍රකාශය</u>

එයිට්කන් ස්පෙන්ස් හී අපේක්ෂාවන් වනුයේ -

A. තිරසර මෙහෙයුම් සමඟ අපගේ සමාගම සංවර්ධනය කිරීම සඳහා හේතුකාරක වන නෛතික සහ නියාමන අවශ්‍යතාවන්හී වඩාත් හොඳ පරිචයන් අත්පත් කර ගැනීමට හැකි පාලන ව්‍යුහයක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම,

B. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ එක්සත් ජාතීන්ගේ විශ්ව සම්මුතියේ මූලධමර් දහය, කාන්තාවන් බලගැන්වීමේ ප්‍රතිපත්ති, සහ සමාගමේ අනෙකුත් ස්වේච්ජා අනුමැතීන් අදාළ කර ගැනීම තවදුරටත් ශක්තිමත් කිරීම,

C. සදාචාරාසම්පන්න ලෙස ව්‍යාපාරික කටයුතු සිදු කිරීම සහ ආචාරශීලී ලෙස ව්‍යාපාරික කටයුතු සිදුකිරීම සඳහා අපගේ හවුල්කරුවන් දිරිමත් කිරීම සහ සහාය සැලසීම,

D. සංවිධානාත්මක මෙහෙයුම් කටයුතු වලදී පාරිසරික කළමනාකරණ පද්ධතීන් භාවිතය සහ දැඩි පාරිසරික බලපෑම් ඇතිවිය හැකි ක්‍රියාකාරකම් වලක්වාලීම පිණිස පියවර ගැනීම,

E. දේශගුණික විපයර්‍යාස සහ අනෙකුත් ආපදා තත්වයන්ගෙන් සංවිධානයේ මෙහෙයුම් කටයුතු වලට සහ හවුල්කරුවන්හට ඇතිවිය හැකි බලපෑම් හඳුනාගැනීම සහ ඒවා අවම කිරීම සහ ඊට අනුවතර්නය වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාගර් ගැනීම,

F. හවුල්කරුවන් සමඟ එක්ව කටයුතු කිරීම සහ සැලසුම්කරණයේදී සහ මෙහෙයුම් කටයුතු වල අවශ්‍ය පියවරයන්හී දී ඔවුන්ගේ දායකත්වය සළකා බැලීම,

G. තිරසර ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සැපයුම් දාමයන් දිරිමත් කිරීම,

H. උපායමාගර්ික තීරණ ගැනීමේ දී සමාජමය සහ පාරිසරික පාලනයක් ස්ථාපිත කිරීම,

J. අදාළ වන අවදානම් තත්වයන් පිළිබඳ සැළකිල්ල යොමු කරමින් සංවිධානයේ මෙහෙයුම් කටයුතු වලදී තිරසර ක්‍රියාපටිපාටි භාවිතා කිරීම,

K. පාරිභෝගිකයන් වෙත සපයනු ලබන සැකසුම් සහ භාණ්ඩ හා සේවාවන් ආශ්‍රිත ප්‍රවධර්ීකරණයන්ට සහ නවෝත්පාදනයට අනුබල දීම,

L. ලාභදායීත්වය සහතික කරමින් පාරිභෝගිකයන් වෙත සපයනු ලබන නිෂ්පාදන , සේවා සහ වටිනාකම් වල ගුණත්වය අඛණ්ඩව වැඩිදියුණු කිරීම,

M. තිරසර ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති වලට හවුල්වීම සහ සේවක සහභාගීත්වය දිරිමත් කිරීම,

N. රැකියා නියුක්තිය සඳහා අවස්ථා සැපයීම මඟින් දේශීය ප්‍රජාව වෙත සහනය සැලසීම සහ හැකි සෑම අවස්ථාවකදී ම දේශීය සැපයුම්කරුවන් වෙතින් මිලදී ගැනීම,

O. සේවකයන් වෙත ආරක්ෂාව සහ සෞඛ්‍ය තත්වය සහතික කළ වැඩ පරිසරයක් සැපයීමේ පදනම වශයෙන් රැකියාව ආශ්‍රිතව සෞඛ්‍යය සහ ආරක්ෂාව කළමනාකරණය කරනු ලබන ක්‍රියා පිළිවෙත් භාවිතා කිරීම,

P. ශක්තිමත් සහ මනා අභිප්‍රේරණ හැකියාවන්ගෙන් යුක්ත, තරගකාරී මානව සම්පතකින් සන්නද්ධ වීම,

Q. අන්තජර්ාතික වශයෙන් ප්‍රකටව ඇති මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තවදුරටත් තහවුරු කිරීම සහ ප්‍රවධර්නය කිරීම,

R. අන්තජර්ාතික වශයෙන් අනුමත කළ නිදෙර්ශයන්ට සමගාමීව කායර්සාධන තොරතුරු කළමනාකරණය කිරීම සහ වාතර්ා කිරීම,

S. අදාළ වන රෙගුලාසි, මාගෙර්ාපදේශ, ප්‍රතිපත්ති කායර් රාමු සහ කමර්ාන්තය ආශ්‍රිත ප්‍රමිතීන් හා අනුකූල වීම සහ සැලකිලිමත්වීම හරහා  සංවිධානයේ සංවේදී තොරතුරු සහ අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ආරක්ෂා කිරීම,

T. සමාගමේ සන්නිවේදන කටයුතු වලදී; ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, ජනවාගර්ිකත්වය, සංස්කෘතිය හෝ සමාජ කණ්ඩායම් හෝ දේශපාලනික වශයෙන් පක්ෂග්‍රාහී වීම; සේවකයන් කෙරෙහි වෙනස් ලෙස සැලකීම; හෝ පීඩාකාරී ආකල්ප විදහා දැක්වීමෙන් වැළකීම,

U. සියලුම සතුන් මානුෂීය සත්කාරයක් අවශ්‍ය කෙරෙන සංවේදනශීලී සත්වයන් වශයෙන් සැලකීම සහ අපගේ මෙහෙයුම් කටයුතු වලදී සත්ව සුභ සාධනය දිරිගැන්වීම,

V. වාෂර්ික කායර්සාධන සමාලෝචනය සහ සැලසුම්කරණය වැඩිදියුණු කිරීම.

**<u>ක්‍රියාත්මක කිරීම</u>**

මාගෙර්ාපදේශ සකස් කිරීම සහ නියෝග පැනවීම සම්බන්ධයෙන් එයිට්කන් ස්පෙන්ස් පී එල් සී හී අධ්‍යක්ෂ මණ්ඩලය, අධීක්ෂණ මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය සහ ප්‍රවතර්නීය කමිටුව වගකීම දරනු ලැබේ.

ක්‍රියාත්මක කිරීමේ සහ පැහැදිලි කිරීමේ සටහන් වල සෑම පියවරක්ම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් ඇතුලත් කායර්රාමුවක් ද අභ්‍යන්තර වශයෙන් බෙදා හැරීම සඳහා වන ප්‍රතිපත්ති ප්‍රකාශය සමග ලබා දෙනු ඇත.

කමර්ාන්තය වෙත ඇති අදාළත්වය මනසේ රඳවාගෙන ක්‍රියාත්මක කිරීමේ පද්ධතීන් හරහා ක්‍රමානුකූලව ප්‍රතිපත්ති වලට අනුකූල වීම සම්බන්ධයෙන් උපාය මාගර්ික ව්‍යාපාරික ඒකක කටයුතු කරනු ඇත. සංවිධානයේ මෙහෙයුම් කටයුතු වල ස්වභාවය සහ පරිමාණය සම්බන්ධයෙන් සමාජ, පාරිසරික සහ ආථර්ික පාලන ප්‍රමුඛතා සපුරාලීමට අවශ්‍ය කායර්රාමු සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ පරිචයන් හරහා කායර්යන් ඉටු කිරීමේදී සෑම උපායමාගර්ික ව්‍යාපාරික ඒකකයක්ම විසින් නායකත්වය ඉසිලීම අපේක්ෂා කෙරේ.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු වස් අවශ්‍ය අවස්ථාවන්හීදී දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කරනු ඇත.

| ***Document Control: Aitken Spence Integrated Sustainability Policy, V4, Sinhala*** | |
|---|---|
| Date of review: | 03.04.2023<br>(Tamil translation updated) |
| Date of most recent previous review: | 26.10.2018 |
| Reviewed by:<br>**Dr. Rohan Fernando**<br>Director – Aitken Spence PLC,<br>as the Head of Sustainability for the Aitken Spence Group<br>Dr. Rohan Fernando<br>Digitally signed by Dr. Rohan Fernando<br>Date: 2023.06.08 12:48:10 +05'30' | |